සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ................................................ විභාග අංකය :- ..................

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

(01) පෘථිවිය සූර්යයා වටා පරිභ්‍රමණය වීමට ගතවන කාලය
(1) දින 265කි. (2) දින 365කි. (3) පැය 24කි. (4) පැය 12කි.

(02) ජාත්‍යන්තර දින රේඛාව ලකුණු කිරීමට පදනම් කරගෙන ඇති දේශාංශය වන්නේ,
(1) නැගෙනහිර දේශාංශ $80^0$ ය. (2) බටහිර දේශාංශ $90^0$ ය.
(3) දේශාංශ $180^0$ ය. (4) දේශාංශ $0^0$ ය.

(03) ලෝකයේ විශාලතම සාගරය වන්නේ,
(1) පැසිෆික් සාගරය යි. (2) ඉන්දියන් සාගරය යි.
(3) අත්ලාන්තික් සාගරය යි. (4) ඇන්ටාක්ටික් සාගරය යි.

(04) 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අගය
(1) 63%කි. (2) 98%කි. (3) 54.5%කි. (4) 92%කි.

(05) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ නගරය ලෙස සැලකෙන්නේ,
(1) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ය. (2) කොළඹ ය.
(3) ගාල්ල ය. (4) මහනුවර ය.

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ කියවා නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(06) පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර 510ක් පමණ වේ. ( )

(07) මහාද්වීප ආසන්නයේ හා අභ්‍යන්තර ප්‍රදේශවල පිහිටා ඇති කුඩා ජලතල මුහුදු ලෙස හැඳින්වේ. ( )

(08) වෙරළ මායිමේ සිට නාවික සැතපුම් 12ක සීමාව යාබද මුහුදු සීමාව වේ. ( )

(09) සමනල කන්ද ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ශේෂ කන්දකි. ( )

(10) ශ්‍රී ලංකාව නිවර්තන කලාපයේ පිහිටි රටකි. ( )

- අංක 11 සිට 15 දක්වා දී ඇති වගන්තිවල හිස්තැන සඳහා සුදුසු වචනය වරහන තුලින් තෝරා ලියන්න.

( වස්ගමුව , ත්‍රිකුණාමලය , වුන්ඩිකුලම් , පාසිකුඩා , පොළොන්නරුව , කයිට්ස් )

(11) ගංවතුර ආපදාවට ලක්වන දිස්ත්‍රික්කයක් වනුයේ ................................................ ය.

(12) ශ්‍රී ලංකාවේ දර්ශනීය වෙරළ තීරයක් ලෙස ................................................ හැඳින්විය හැකි ය.

(13) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති කුරුලු අභය භූමියක් ලෙස ................................................ වැදගත් වේ.

(14) වනෝද්‍යාන අතර ................................................ වනෝද්‍යානයට වැදගත් තැනක් හිමිවේ.

(15) යාපන අර්ධද්වීපය ආශ්‍රිතව ................................................ දූපත පිහිටා ඇත.

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(16) ආදර්ශ ගෝලයේ උතුරු අර්ධ ගෝලය හා දකුණු අර්ධ ගෝලය වෙන් කරන අක්ෂාංශ රේඛාව නම් කරන්න. ................................................

(17) ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුවට දිග කිලෝමීටරවලින් ලියා දක්වන්න. ................................................

(18) දඬුවැට භාවිතා කරනු ලබන්නේ කුමන වගා කටයුත්තක් සඳහා ද? ................................................

(19) මැයි සිට සැප්තැම්බර් දක්වා කාලයේ ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ක්‍රමය හඳුන්වන්නේ කුමන නමකින් ද? ................................................


(20) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් කරන පටු මුහුදු තීරය නම් කරන්න. ................................................

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.

(01) ලෝක ආකෘති සිතියමේ A සිට H දක්වා ලකුණු කර ඇති ස්ථාන නම් කරන්න. (ලකුණු 2 × 8 = 16)



(02) (1) උතුරු අක්ෂාංශ 23 1/2° රේඛාව හා දකුණු අක්ෂාංශ 23 1/2° රේඛාව හඳුන්වන වෙනත් නම් පිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 02)

(2) ලෝකයේ මහාද්වීපවලින් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(3) යාපන අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත භූ දර්ශනයේ සුවිශේෂී ලක්ෂණ පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 05)

(03) (1) ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප 03කි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ශ්‍රී ලංකාව ආශ්‍රිතව දැකිය හැකි ස්වාභාවික නිර්මිත 04ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) ශ්‍රී ලංකාවේ ආදි වාසීන් ජීවත්වන ප්‍රදේශ දෙකක් නම් කර, ඔවුන් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (1) දකුණු ආසියානු කලාපයට අයත් රටවල් 02ක් නම් කරන්න. (ලකුණු 02)

(2) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පහසුකම් වැඩි දියුණු කිරීම තුළින් බලාපොරොත්තු වන ඉලක්ක 04ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) ඔබ ප්‍රදේශයට ආවේණික සංස්කෘතික අංග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (1) මධ්‍ය කඳුකරය ආශ්‍රිත දියඇලි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) තෙත් කලාපීය භූ දර්ශනය ආශ්‍රිතව දැකිය හැකි ලක්ෂණ 04ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) ශ්‍රී ලංකාවේ වෙරළ භූ දර්ශනයට මානුෂ ක්‍රියාකාරකම් හේතුවෙන් හානි ගෙන දෙන ක්‍රම 02ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (1) ශ්‍රී ලංකාවේ නියඟය බලපාන දිස්ත්‍රික්ක 02ක් නම් කරන්න. (ලකුණු 02)

(2) ගංවතුර ඇතිවීමට බලපාන හේතු 04ක් ලියන්න. (ලකුණු 04)

(3) නායයෑම් ඇතිවීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් 02ක් හා ආපදා අවස්ථාවක ගත යුතු ක්‍රියා මාර්ග 03ක් සඳහන් කරන්න. (ලකුණු 05)

(07) (1) විවිධ සිතියම් වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) සිතියමක් පිටලස් කිරීමට අවශ්‍ය උපකරණ 04ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) සිතියමක මූලිකාංග දෙකක් නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)